
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND
*Phone* : **020 74289388**
*Fax* : **0871 9005163**
E-mail : **lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
***Editor*** : **Daya Ananda Ranasinghe**
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
***Art*** : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
***Computer Graphics*** : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
***Photography*** : Ananda Kariyawasam



# මිනිසත්කමට නිගාවක් වූ ශ්‍රීලංකා පොලිසිය

**පො**ලිසියේ මනුස්සයින් දැනට නැති බවත්, ඉන්නේ අමනුස්සයින් බවත් මේ ළඟදි මගේ හිතවතෙකු මට කීය. මිනිස් සමාජයට අහිත කර, එසේම සමාජය විසින් දුරින් තැබිය යුතු, එපාම කරපු **P** අකුරු පහක් ලොව ඇති බව කී ඔහු, ඉන් එක **P** අකුරකින් අර්ථවත් වන්නේ පොලිසිය බවත් කීය. ඒ කියමන් සියල්ලම සැබෑ බව අපේ බම්බලපිටිය පොලිසිය ගිය සතියේ මනාව ලොවට ම විදහා දැක්වූවා ය.

රත්මලානේ නිවැසි බාලවර්ණම් සිවකුමාරන් නමැති ද්‍රවිඩ තරුණයා මානසික රෝගියෙකි. ඔහු අංගොඩ මානසික රෝහලේ නිතර ප්‍රතිකාර ද ලබන්නෙකි. සාමාන්‍ය ලෙස ජීවත්වන නමුදු ඉඳහිට පිස්සුව තදවූ විට ඔහු කරන්නේ පාර මැද්දට පැන රථවාහන වලට අවහිර කිරීමය. එසේ නැතහොත් යන වාහනවලට ගල් ගැසීම ය. එදිනද ඔහුට පිස්සුව තදවූ දිනයකි. ඔහු බම්බලපිටියේ ගාලු පාරට නුදුරු තැනක ඉඳ වාහන වලට ගල්ගසන්නට වූයේ ය.


කිසිවෙකු මේ බව බම්බලපිටිය පොලිසියට දන්වන ලදුව පොලිස් නිලධාරීන් කීප දෙනෙක් දුවගෙන ආහ. සිවකුමාරන් ඔවුන්ටද ගල්වලින් ගැසුවේය. ඔහු උන්මත්තකයෙකු බව දකින ඕනෑම කෙනෙකුට වැටහෙනු නොඅනුමාන ය. පොලිසිය ඔහු පසුපස පන්නා යද්දි තරුණයා වැල්ල දෙසට දුවගොස් මූදට පැන්නේ ය.

පොලිස් නිලධාරීහුද මුහුදට පැන්නෝය. ඒ පොලුද අතැතිවය. ඔව්හු පොලුවලින් මුහුදේ ඒ මේ අත පනින සිවකුමාරන්ට පහර දුන්නෝය. අසරණ වු තරුණයා අත් දෙක හිසට ඔසවා ගහන්න එපායයි කියන්නාසේ පොලිස්කාරයින්ට වැන්දේය. එහෙත් පොලිස්කරුවෝ නොනවත්වා ඔහුට පොලුවලින් ගැසූහ. සිවකුමාරන්ගේ පණ නැති සිරුර මුහුදේ නොපෙනී ගියේය. පසුදා මිනිය ගොඩට පාවී තිබුණි.

මේ සියල්ල සිදුවූයේ හොර රහසේ නොව මහ දවල් දෙනෝදාහක් බලාගෙන ඉන්දැද්දිය. සමහරු මේ ඝාතනය කැමරාගත කළහ. වීඩියෝ ගත කළහ. එහෙත් කිසිවෙක් මේ තරුණයා බේරාගන්නට ඉදිරිපත්වූයේ නැත. ටීවන්වල් රූපවාහිනී කණ්ඩායම ගොස් මේ සියල්ල කැමරාවට නගා එදිනම ලංකාව පුරා විකාශනය කර හැරියේය. උන්මත්තක අහිංසකයෙකුට පොලිසිය පහරදී මරාදමන අයුරු මුළු ලංකාවම බලා සිටියේ ඇස් අදහාගත නොහැකි කම්පනයෙනි. මෙම වීඩියෝ පටය දැන් ලොව පුරාම දෙමළ ඩයස්පෝරාව ප්‍රචාරය කරති.

මිනිස් අයිතීන් උල්ලංඝණය කරනවායයි ශ්‍රීලංකාවට එරෙහිව දැන් බටහිර රටවල් එකතුව ගෙනයන ව්‍යාපාරයට මේ පොලිස් ක්‍රියාව හොඳ සාක්ෂියක් නොවේද? ලංකාව මිනිස් වාසයට නුසුදුසු රටක්ලෙස හංවඩු ගසන්නට අපේ සතුරන්ට අමුද්‍රව්‍ය සම්පාදනය කරන්නේ අපේ පොලිසියේ නරුමයන් නොවේද? මහා ත්‍රස්තවාදයක් මුළිනුපුටා දැමූ ශ්‍රී ලංකාවට ඒ කීර්තියට මහා කළු තාර පැල්ලමක් එක් කළේ ලංකා පොලිසියයි. මෙවැනි පොලිසියක් රටකට තබා අපායටවත් සුදුසු නැත.

# සිහිය උපදවාගැන්ම හා ආරක්ෂාකරගැන්ම



♦ *පූජ්‍ය නාවලපිටියේ අරියවංශ ස්වාමීන්වහන්සේ*

**ශ්‍ර**ද්ධාවන්ත පින්වතුනි, භාවනාව පුරුදුවන කෙනෙක් ආරම්භක අවධියේදී කුමක්ද කළ යුතු කියන කාරණාවයි මම පැහැදිලි කරන්නෙ.

භාවනාව පුරුදුවන කෙනෙක් ආරම්භක අවධියෙද් කළ යුතු වන්නෙ සිහිය උපදවා ගැන්මත්, එසේ උපදවාගත් සිහිය ආරක්ෂාකරගැනීමත්, එය දියුණු කරගැනීමත් තමයි කළ යුතු වන්නේ. පසුවට කළ යුතු වන්නේත් එයම තමයි. සිහිය උපදවා ගෙන එය රැකගැනීම. භාවනාවෙන් අපි අපේක්ෂා කරන්නේ සිහිය දියුණුවීම. ඒ සිහිය දියුණු කිරීමෙන් අපි කරන්න කල්පනා කරන්නේ සංසාරෙන් නිදහස් වීම. සංසාරෙට බැඳිලා ඉන්න ස්වභාවය වළක්වා ගැනීම. නොබැඳි ඉන්න ස්වභාවයට පත්වෙන්නයි අපි සිහිය දියුණු කරගත යුතු වන්නෙ.

එහෙනම් අපි තේරුම් ගන්න ඕන සිහිය නැත්තේ යම් තැනකද, එතැන දී සිත විවිධ දේවල බැඳෙන බව. අපි ඩිංග ඩිංග හරි සිත දියුණු කළොත් ඒ බැඳෙන ස්වභාවය අඩුවෙලා යන බව පැහැදිලියි. යම් කලකදී පරිපූර්ණ වශයෙන් සිහිය දියුණු කළොත් බැඳෙන ස්වභාවය සම්පූර්ණ වශයෙන්ම අවසන් වෙනවා. එසේ නම් භාවනාවෙන් අපේක්ෂා කරන්නෙ බැඳීම අයින්කරගැනීම. සංසාරෙට බැඳෙන ස්වභාවය අයින් කරගැන්ම. භාවනාව සම්පූර්ණ වශයෙන් දියුණු කළා කියන්නෙ සංසාරෙන් නිදහස් වුණා කියන එකයි. එහෙනම් සිහිය පරිපූර්ණ වශයෙන් දියුණු කිරීමෙන් තමයි ඒක සිදුවන්නෙ. කෙනෙක් යම් කලකදී සිහිය පරිපූර්ණ වශයෙන් දියුණු කළා නම් එදාට ඒ බැඳෙන ස්වභාවයෙන් සම්පූර්ණයෙන්ම නිදහස් වෙලා යනවා.

ඒ දේ හොඳට මතක තියාගන්න. එහෙම නැත්නම් සාමාන්‍ය කෙනාට එන අදහස තමයි භාවනාව පටන්ගත්ත ගමන් වැඩි වේලාවක් ඉන්ට ඕන කියන අදහස. ඒ අදහස අතහරින්න. කාලය ගත කිරීම නෙවෙයි වඩා වැදගත් වන්නෙ. ඒකෙන් අදහස් වෙනවද කාලය ඕන නෑ කියලා? ඒක වරදවලා ගන්නත් එපා. මේ විනාඩියක් දෙකක් භාවනා කරලා සංසාරෙන් නිදහස් වෙන්න බෑ. විනාඩි දෙකක් විනාඩි පහක් භාවනා කරලා සංසාරෙන් නිදහස් වෙන්න පුළුවන්ද? එහෙම බෑ.

මේක බහුල වශයෙන් කරන්න ඕන දෙයක්. බහුල වශයෙන් යමක් කරන්න නම් මොකක්ද අපට තිබිය යුතු සුදුසුකම? ඒක කරන්න පුළුවන් වෙන්න ඕන. මේ විනාඩි දෙකක්වත් කරන්න බැරි මනුස්සයා බහුල වශයෙන් කරන්නෙ පුළුවන්ද? බෑ. එහෙනම් අපි මුළින්ම ටික ටික කර කර පුරුදුවෙන්න ඕන. මොකක්ද? ඒ සිහිය උපදවා ගැනීමත්, ඒ උපදවාගත් සිහිය ආරක්ෂා කරගැනීමත් තමයි ටික ටික පුරුදු වෙන්නෙ. වෙන මොකවත් නැහැ. අමුතු ගුප්ත දෙයක් මෙතන නැහැ. තමා තුළ සිහිය උපදවාගැනීමයි ඒ උපදවාගත් සිහිය රැකගනිමින් දියුණු කිරීමයි තමයි භාවනාවෙන් කරන්නෙ.

# The sorrow and the sadness

Sorrow and sadness is a burning of mind associated with loss of relatives, loss of job, social position, lover, spouse, and whatever favoured belonging. Where grief oppresses mind, sorrow has inner consuming as characteristic. Its function is to consume the mind completely, as if eating it up from inside.

It is manifested as a constant gloomy sadness of a deprived depressed mind. It is suffering, because it is an intrinsic mental torment, where the mind with this melancholic state as its basis & source tortures itself even more!

This sadness is part & parcel of the The 1st Noble Truth on Suffering...

Sorrow is like a poisoned dart !
That penetrates a being's heart
Setting up a consuming burning there
Like burning with a red-glowing spear
This state of mind brings future pain:
Such as disease, and then ever again:
Ageing and death, so one may thus tell
Wherefore it is called pain as well...

♦ **Ven. Bhikku Samahitah**



# ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

## හිතොපදේශයෙන්

යස්‍ය කස්‍ය ප්‍රසූතො.පි - ගුණවාන් පූජ්‍යතෙ නරඨ
ධනුර් වංශ විශුද්ධො.පි - නිර්ගුණං කිං කරිශ්‍යති

**අර්ථය** : *යම් කිසිවෙකුගේ වංශයක උපන්නාවූද, මිනිසා ගුණවත් නම් පුදනු ලැබේ. දැව ජාතියෙන් උසස් වුවත් දුන්න දුනු දිය රහිත වූයේ නම් කුමක් කරන්නද?*

**ය**හපත් ගුණවත් සත්පුරුෂ පුද්ගලයා උදාර සිතුම් පැතුම් වලින් හෙබි උතුම් මිනිස් චරිතයක් යයි හැඳින්විය හැකිය. හෙතෙමේ සමාජයේ උසස් පහත් භේද නොසලකයි. හේ සියලු සතුන් කෙරෙහි මෛත්‍රිය පතුරුවයි. ඔහු පුණ්‍යවන්තය. පළමුව පාපයෙන් නිදහස් වන ඔහු ලෝකය පාපයෙන් නිදහස් කිරීම සඳහා සිය ජීවිත කාලය පුරා කටයුතු කරයි. වෙහෙස මහන්සි වෙයි. ගුණවත් පුද්ගලයා සමාජයේ දුසිරිත් නමැති අඳුරු පටල ඉරා දමා සුචරිතය නමැති ආලෝකය උදා කරයි.

නපුරු ගතිය මනුෂ්‍යයාගේ යහපතට හේතු නොවේ. නපුරු මිනිසුන් ආශ්‍රය කිරීමෙන් සතුටක් ද නොලැබේ. නපුරු මිනිසුන්ගේ දරුවන් වී ඉපදීම ඒ දරුවන්ට ද සැපතක් නොවේ. ගුණ නැණ දෙකින් දුරස්වන පුද්ගලයා ආත්මාර්ථකාමියෙකු වේ. ආත්මාර්ථකාමීබව වැඩිවන තරමට දයාව, අනුකම්පාව වැනි ගුණධර්ම මිනිසා කෙරෙන් දුරස් වේ. කෙනෙකු ලෝභී නම් තවත් කෙනෙකුගේ දුකකට උපකාරීවීමට නුපුලුවන. කෙනෙකු නපුරු නම් තවත් කෙනෙකුට පිහිටවීමට නුපුලුවන. අපේ සිත්වල උපදින සිතුවිලි ලෝකයේ යහපත උදෙසා යෙදවිය යුතුය යන්න යහපත් පුද්ගලයන්ගේ පරමාර්ථයයි. ජීවිතයේ සැබෑ අරුත හඳුනා ගන්නා අනුන්ගේ ජීවිත ආලෝකමත් කිරීමට යත්න දරයි.

ජීවිතයේ නිවැරදි ස්වරය ස්පර්ශ කිරීමේ වාසනා ගුණ මහිමය අප හැම කෙනෙකු තුළම පවතී. එහෙත් ඇතැම් විට අපේ චර්යා අපට ඊට බාධා පමුණුවයි. ලෝකයේ විශිෂ්ට මිනිසුන්ගේ සංඛ්‍යාව අල්ප වන්නේ මේ නිසාය. එය වෙනස් කළ හැක්කේ ද මිනිසාට පමණය. එබඳු අය අන් අයට වඩා වෙනස් මිනිසුන් ය. ඒ වෙනස් මිනිස්සු ලෝකය වෙනස් කරති. ගතානුගතික ලෝක ඊට විරුද්ධ දිසාවට යොමු කරවති. ගෞතම බුදුන් වහන්සේ වැනි ශ්‍රේෂ්ඨ ආගමික නායකයින්, අනගාරික ධර්මපාල, මහත්මා ගාන්ධිතුමා වැනි උදාර උතුමන් එබඳු අයයි. මහත්මා ගාන්ධිතුමාගේ අදහසට අනුව පිවිතුරු ජීවිතයක් මැවීමට සමත්කම ලබන්නේ ලොව ස්වල්ප දෙනෙකුට පමණි.

අද ලොව ගැටුම් වලින් පිරී පවතී. පුද්ගලයා තුළ මෙන්ම පුද්ගලයින් අතරද ගැටුම්ය. පවුල් අතරද එම පවුල්වල සාමාජිකයන් අතරද ගැටුම්ය. ගම් අතරද රටවල් අතරද ගැටුම්ය. මේ විදියට බලන විට ක්‍රමයෙන් ලෝකයම ගැටුම් වලින් විනාශ මුඛය කරා ගමන් කරයි. එපමණක් නොව සමස්ථ සමාජයේම බහුතරය තුළ ගුණධර්ම පිරිහෙමින් පවතී. යළිත් මිනිසාගේ මනස තුළ ගුණධර්ම වගා නොකොට කෙරෙන වෙනත් කිසිම කාර්‍යයකින් මෙම ගැටුම් නිරාකරණය කළ නොහැකි ය.

මනුෂ්‍යත්වය යන සුන්දරත්වය අපේ ජීවිතවලින් අර්ථවත් කිරීමට අපට හැකියාවක් වේ නම් මීට වඩා සුන්දරවූත්, යහපත්වූත් ලෝකයක ජීවත්වීමේ භාග්‍යය අපට උදාවනු ඇත. ඒ සඳහා ලෝභය, වෛරය, පළිගැනීම වැනි තැන්වලට පරිත්‍යාගය, දයානුකම්පාව වැනි ගුණධර්ම ආදේශ කළ යුතු ය.

*රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති*
♦ ***පූජ්‍ය විල්ඔයේ විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**



**NORMA & Co**
**Associate Solicitors**
**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**
**Any type of Visa Applications**
**Car Accidents**
***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**